# හද රිදවන මතක සුවඳ 3



**..........මගේ සිතට ශෝකය ගලා එන්නට විය. ඒ ශෝකය හේමක්කලා ලීලලා ප්‍රසාදිකාල චාන්දනීල ගමගේ නංගිල හේවගේ නංගිල රමණි වැනි සහෝදරියන් ගැන උපන්නකි. ගැහැනුන් ස්වභාවයෙන් රන් ආභරණවලට ආශා ඇත්තෝය. මෙම සහෝදරියන් එම ස්වාභාවික ගැහැනු ආශාව යටපත් කරගෙන ඇත. කනකර පාළුවට තබාගෙන සිටින්නේ වැර වෑයමෙන් හදාගත් සිතින් විය යුතුය. ප්‍රසිද්ධ රැස්වීම් අමතන රෝහණ සොයුරා රැස්ව සිටින ජනතාවගෙන් ආධාර ඉල්ලා සිටින විට කනකර ආභරණ ගලවා පරිත්‍යාග කරන කාන්තාවෝ මම දැක ඇත්තෙමි........**

රෝහිත මුණසිංහ - ප්‍රංශයේ සිට

"දේශපාලනයේදී සදාකාලින මිතුරන් හෝ සතුරන් නැත' යන කියමනක් තිබේ. මෙය බොහෝ විට සත්‍යයක් සේ පෙනෙයි. 1983 දී පවත්වන ලද "ලාම්පු කළගෙඩි මගඩිය" යයි නම් ලද ජනමත විචාරණය අන්ත දූෂිත ඡන්දයකි. මෙම දූෂිත ඡන්දයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලද්දේ ජවිපෙ විසිනි. 1987-89 අරගලය මර්දනය කිරීම සඳහා ආරක්ෂක ඇමතිව සිටි රංජන් විජේරත්න ක්‍රියා කළේ යම්සේද 71 අරගලය මැඩ පැවැත්වීම සඳහා ෆිලික්ස් ඩයස් බණ්ඩාරානායක මූලික වුයේද එසේමය. එවිට ඔහු හැඳින්වූ අන්වර්ථ නාමය වුයේ "සාතන්" ය. ජේ. ආර්. ගේ යු.ඇන්.පී. රජයට විරුද්ධව ජවිපෙ ඉදිරිපත් කරන ලද ජනමත විචාරණ ඡන්ද පෙත්සමට පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නීතිවේදියා වුයේ ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතාය. නොහොත් සාතන්ය.

1988 වර්ෂයේදී ජනාධිපති ඡන්දය එළඹෙන්නේ රට ගිනි ගන්නා අතරතුරේදී ය. එම ජනාධිපතිවරණය සඳහා පොදු අපේක්ෂකයෙකු යොදා එක්ව තරග කිරීම ගැන ජවිපෙ සහ ශ්‍රීලනිප අතර සාකච්ඡා පැවැත්විණ. ඉහත සඳහන් වු කියමන සනාථ කරමින් එම අවසන් සාකච්ඡාව පවත්වන ලද්දේ බණ්ඩාරනායක මැතිනිය සමගය. ජවිපෙ වෙනුවෙන් ඒ සඳහා ගියේ වත්මන් නායක සෝමවංශ අමරසිංහ සහෝදරයාය. බණ්ඩාරනායක මැතිනියගේ දැඩි ස්ථාවර නිසා සාකච්ඡා බිඳ වැටිණ. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ තර්ජන වර්ජන හා දැඩි බාධා කිරීම් හමුවේ පවත්වන ලද ජනාධිපති තරගයෙන් බණ්ඩාරනායක මැතිනිය පරාජයට පත්ව ප්‍රේමදාස මහතා ජය ලැබීය. එක් අතකින් එය ජවිපෙ විසින් බණ්ඩාරනායක මැතිනියගෙන් ලේවල පලිය ගත් ආකාරයක් බඳුවිය. එදා එසේ වුවානම් මෙසේ විය හැකැයිද. මෙසේ වුවා නම් එසේ වන්නට තිබිණියිද දැන් තර්ක කළ හැකි වුවත් යම් හෙයකින් එම ජනාධිපති ඡන්දයෙන් ජය ගත්තේ බණ්ඩාරනායක මැතිනිය නම් එවිට ද දේශප්‍රේමී අරගලය පෙරසේද දියත් විණි නම්, ඇයද ප්‍රේමදාස ජනාධිපතවරයා කළ දෙයම නොකර සිටිවියැයි කිසිවෙකුට සහතික විය නොහැක.

1977 මහ මැතිවරණයෙන් ආසන 8 කට බැස කුපිත වෙන්නටම පරාජය වු ශ්‍රීලනිප මුහුණ දුන්නේ කෙළවරක් නැති අවුල් වියවුල් ජාලයකටය ජේ. ආර්. විසින් මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරම්මෙන් පසු ශ්‍රීලනිප ය කබලෙන් ලිපට වැටුණාක් මෙන් විය.

1970 දී (2/3) තුනෙන් දෙකක විශාල ජනවරමක් ලබා වසර 7 ක් රට කරවු පක්ෂයක් මරණාධාර සමිතියක තත්වයට වැටුණේ ය.

තමන්ට සිටින ප්‍රතිවාදී දෙදෙනාගෙන් වඩා දුර්වල ප්‍රතිවාදියාට පළමුව පහරදී පසුව අනෙක් ප්‍රතිවාදියාට පහර දීමේ න්‍යායය අනුගමනය කළ ජවිපෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගමනක අවසානය යන මැයෙන් වු දේශන මාලාවක් රටපුරා පැවැත්වීමට තීරණය කෙළේය. විජේවීර සහෝදරයා විසින් පවත්වන මෙම දේශන මාලාව ඔහුගේ චතුර හා මුබරී කථිකත්වය නිසාත් ඉදිරිපත් කරන ලද කරුණු නිසාත් අතිසාර්ථක විය. විජේවීර සහෝදරයා-ගේ විවාහය සිදුවුයේ ද මෙම දේශනය රටවටා පවත්වමින් සිටි කාලයේදීමය.

'ශ්‍රීලනිප යේ ගමනක අවසානය' මාතර දී පවත්වන ලද්දේ උයන්වත්තේ ක්‍රීඩාංගනයේ ප්‍රසිද්ධ වේදිකාවකදීය. විජේවීර සහෝදරයා විවාහ වී සතියක් වත් ඇති නැති තරම් වු කාලයේ දී ඔහු දේශනයට පැමිණියේ සිය මනාලිය ද කැටුව ය. රෝහණ සහෝදරයා වේදිකාව මත නැගී දේශනය පවත්වාගෙන යද්දී චිත්‍රාංගනි විජේවීර සහෝදරිය පක්ෂයේ අනෙකුත් සහෝදරියන් අතරට වී අහිනය පාමින් වක්කඩක් කැඩුවාක් මෙන් වචන දෝරේ ගලා යවමින් හාස්‍ය රසය හා උපහාස රසය කුළු ගන්වමින් කථා කරන සිය සැමියා දෙස නෙත් දල්වා බලා උන්නීය.

චිත්‍රාංගනි සහෝදරිය වටා සිටි පක්ෂයේ සහෝදරියන් සියලුම දෙනා ඇඳගෙන හිටියේ සාය හැට්ටය හෝ ගවුම්ය. බොහෝ විට ඒවා චීත්ත රෙදිවලින් මසන චාම් ඇඳුම් විය. දෙකන් පෙති වල වු කරාබු ජෝඩුවක් හැරෙන්නට ඔවුන් කිසිවෙකු වෙනත් රන් ආබරණ පැලඳ සිටියේ නැත.

මංගල සාරියකින් සැරසී සිටි චිත්‍රාංගනී සහෝදරියගේ දෙඅත කනකර රන් ආභරණ වලින් සැරසී තිබිණ. ඇය පරිවාර ළඳුන් අතර සිටින සිටුකුමරියක සේ පක්ෂයේ සහෝදරියන් මැද කැපී පෙනුණාය. මගේ සිතට ශෝකය ගලා එන්නට විය. ඒ ශෝකය හේමක්කලා ලීලලා ප්‍රසාදිකාල චාන්දනීල ගමගේ නංගිල හේවගේ නංගිල රමණි වැනි සහෝදරියන් ගැන උපන්නකි. ගැහැනුන් ස්වභාවයෙන් රන් ආභරණවලට ආශා ඇත්තෝය. මෙම සහෝදරියන් එම ස්වාභාවික ගැහැනු ආශාව යටපත් කරගෙන ඇත. කනකර පාළුවට තබාගෙන සිටින්නේ වැර වෑයමෙන් හදාගත් සිතින් විය යුතුය. ප්‍රසිද්ධ රැස්වීම් අමතන රෝහණ සොයුරා රැස්ව සිටින ජනතාවගෙන් ආධාර ඉල්ලා සිටින විට කනකර ආභරණ ගලවා පරිත්‍යාග කරන කාන්තාවෝ මම දැක ඇත්තෙමි. ඉදින් එම මෙහොතේ මා සිතමින් උන්නේ තමන්ගේ ආදරණීය නායක සොයුරාගේ බිරිඳ ගැන පක්ෂයේ සහෝදරියන් කුමක් සිතමින් සිටින්නේද යන වගය.

මාතර ලන්දේසි කොටුව ඇති දිසාවෙන් සයුර දෙසට පසු බසින හිරුගේ රශ්මි කදම්බ රෝහණ සහෝදරයා සිටින වේදිකාව මතටද වැටී තිබිණ. එම හිරුරැස් වැදී දිලිසෙන රෝහණ සහෝදරයාගේ වෙදගිල්ලේ පැලඳගෙන ඇති රන් මුදුව මා දුටුවේ ඔහු වේදිකාවට ගොඩවීමටත් ප්‍රථමයෙනි.

ඉන් සතියකට පමණ පසු රැස් වු ආසන කමිටු රැස්වීමේදී මෙම රන් ආභරණ ප්‍රශ්නය මා ඉදිරිපත් කළේ චෝදනාවක් වශයෙන් නොව පැහැදිලි කිරීමක් ලබා ගැනීමේ අටියෙනි. එදින කමිටු රැස්වීමට දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු වන එස්.ඩී. සහෝදරයා හෙවත් පක්ෂයේ මුදල් ලේකම් වු සෝමරත්න කළුආරච්චි ද පැමිණ සිටියේය.

පක්ෂයේ ඉහළ කමිටුව විසින් සංවිධාන රටාවේ යම් වෙනසක් කිරීමට තීරණය කළවිට නව වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවීමට යනවිට අප්‍රේල් සමරු උත්සව මාලාව හෝ මැයි දිනය එළඹෙන විට පක්ෂ සාමාජිකයන් අතර විශේෂිත ප්‍රශ්න පැන නැගුණ විට සෑම දිස්ත්‍රික්කයකම සිටින පූර්ණ කාලීනයක් හා අර්ධ කාලීනයන් කැඳවා ඒ ඒ දිස්ත්‍රික්ක වල රැස්වීමක් පැවැත්වීම සිරිතකි. මෙම අභ්‍යන්තර සාකච්ඡා සභාවල් පවත්වන්නේ පක්ෂ පාසල් නමින් හඳුන්වන යම් ආරක්ෂිත ස්ථානයක ගොඩනගා ඇති විශාල ශාලාවකය. මේ ශාලාවල බිත්ති කටුමැටිය. වහලට පොල් අතුය. ගෙබිමට ගොම මැටි ගා තිබේ. මාතර දිස්ත්‍රික්කයේ පූර්ණ කාලීන සාකච්ඡාවලට බොහෝ විටම පැමිණියේ රෝහණ සහෝදරයාම ය. තමාගේ විවාහයෙන් සති කිහිපයකට පසු පවත්වන ලද එම සාකච්ඡාවේදී රෝහණ සොයුරා මෙසේ පැවසීය.

"ඒ සහෝදරී (ඔහුගේ බිරිඳ) මේ අපේ සහෝදරියෝ වගේ දේශපාලනික වශයෙන් ගොඩ නැගුන පක්ෂයේ සහෝදරියක් නෙවෙයි. අපේ විවාහය දවසේ මට දැඩි විදියට විරුද්ධ වෙන්න බැරි චාරිත්‍ර ටිකක් ඒ සහෝදරිගේ වැඩිහිටියන්ගේ පැත්තෙන් ඉෂ්ඨ කළා. මගේ ඇගිල්ලට මංගල මුද්දක් දැමීම ඉන් එකක්. ටික දවසක් යනතුරු ඒක ඇගිල්ලේ තියා ගන්නට මට සිද්ධ උනා. ඊළගට, ඒ සහෝදරීටත් මට එකපාරටම කියන්න බෑ රත්තරං බඩු ගලවල දාන්න කියලා. මේ අපේ සහෝදරියෝ වගේ එයයි පස්සේ තේරුම් ගනිවි ඒවා අනවශ්‍ය දේවල් කියලා.

කුරිරු ධනේෂ්වර දඩ බල්ලන් විසින් අපෙන් උදුරාගෙන විනාශකර දමන ලද්දේ, අපහට නැතිව ගියේ එවන් නායකයෙකි. තමන් අතින් වු අතපසු වීමක්, වැරැද්දක් පක්ෂයේ සාමාජිකයන් ඉදිරියේ පාපොච්චාරණය කර සමාව අයැදින පක්ෂ සාමාජිකයන් නගන ප්‍රශ්න වලට පිළිතුරු දීමට බැඳී සිටින නායකයෙකි.

(ලබන කලාපයට)


